

# චිම්පන්සින්ගේ මිනිස් මව්වරිය

## ආචාර්ය ජේන් ගුඩ්ඕල්

**ජයන්ත විජේවික්‍රම**

චිම්පන්සි සමාජයේ එකිනෙකා එක්සත්ව කටයුතු කරනු ලැබේ. එයට හේතුව සියලු දෙනාම උපතේ සිට මරණය දක්වා තමන්ගේ සමාජය තුළ සිටින නිසා ය. වැඩිහිටි පිරිමින්ට තනිව ගමන් බිමන් යෑමට අවසර නැත. එහෙත් මව සහ දරුවන් එකට සිටිය යුතු ය.

ජේන් ගුඩ්ඕල් වනාහි තරුණ වියේදී ජන්ගල් බුක්, ටාසන් හා ඩොක්ටර් ඩූලිටර් නම් වූ වනගත ජීවිත අළලා ලියැවුණු පොත් කියවා, ඒ පිළිබඳ අප්‍රිකානු වනාන්තර ගවේෂණය කිරීමේ ආශාවෙන් පෙළඹවනු ලැබූ කාන්තාවක් වූවා ය.

වර්ෂ 1960 දී අවුරුදු විසිතුනක නව යොවුන් තරුණියක වූ ජේන් ටැන්සානියාවේ ගොම්බේ ජාතික වනෝද්‍යානයෙහි චිම්පන්සි රක්ෂණය හා නිරීක්ෂණය සඳහා තම මව සමග පිටත්වූවාය. එම වනෝද්‍යානයට ගියද ඇයට තම සමීප ඥාතීන්ට සමීප වීමට ඉඩ නොලැබිණි.

හිමිදිරි උදෑසන පහයි තිහට පමණ අවදිවන ඇය වරුගණන් දින ගණන් තිස්සේ ගල්තලා තැග සිටියා ය. එසේ සිටියේ, චිම්පන්සි නෑදෑයන් අතර නෑකම් පවත්වා ගෙන යාමේ අදහසිනි. ඇය වරු ගණන්, සමහර දිනවල පැය දෙළහක් තිස්සේ නිරීක්ෂණ කටයුතුවල නියැළී සිටියා ය.

චිම්පන්සි හඬ ඇසුණු වහාම ඇ ඒ වෙත යන නමුත්, ක්ෂණයකින්ම උන් අතුරුදහන් වෙති. පළමු මාස කිහිපය තුළ මීටර් පන්සියයක් පමණ ආසන්න දුරකට ළඟා වෙමින් සිටියදී ඔවුහු පලා ගියහ. දූන් ගුඩ්ඕල් ආචාර්යවරියට කළ හැකි එකම දෙය වූයේ චිම්පන්සි මෙන් වන ලැහැබ තුළ හැසිරීමයි. අපගේ දැනට ජීවත්වන සමීප කැලෑ ප්‍රධානීහු ඔවුන් කෙරෙහි අවධානය යොමු කරන බැව් දැන ගතහොත් රැඳී නොසිට පලා යති. එබැවින් වනයේ ගස්වලින් කඩාගත් අතුපතර මත වැතිරෙන සේයාවක් දක්වමින්, පොළොවේ වලක් හාරන ඉරියව්වෙන් සිටින බැව් තම නෑදෑයන්ට හැඟී යන්නට ඇ සැලැස්වූවාය. මෙලෙස පළමු මාස අට තුළදී මීටර් පනහක් පමණ දුරකට ඔවුන්ට සමීප වන්නට මෙම කාන්තාවට හැකි විය. ආචාර්ය ජේන් ගුඩ්ඕල් අධ්‍යයන කළේ මිනිස් සමාජයේ සිටින විට මෙන් වනයේ වෙසෙන අපේ ආදි මුතුන්මිත්තන් සමග මෙසේ එකට එක් වී ජීවත් වෙමිනි.

"මාස ගණනක් ඉකුත් වූ පසු වයස් ගත වූ පැසුණු රැවුලක් සහිත චිම්පන්සියකු යම් කිසි ආයුධයකින් වේහුඹසක් අවුස්සා එහි වේයන් අනුභව කරන අයුරු ඇයට දැක ගත හැකි විය. එය ශාස්ත්‍රීය සමාජය තුළ ආන්දෝලනයක් ඇති කළ සොයා ගැනීමක් විය." ඇය මෙසේ ද පවසයි "චිම්පන්සි බොහෝ සෙයින් අප වැනිය. කෑ කෝ ගසති. රණ්ඩු සරුවල් කරති. තර්ජන හා බිය ගන්වති. ආචාර සමාචාර කරති. සිප වැළඳ ගනිති. අප මෙන් තදින් වැසි වසින විට චිම්පන්සි තද කණස්සල්ලෙන් පසු වෙති. සීතලෙන් ගැහෙමින් හෙම්බිරිස්සාවෙන් හා කැස්සෙන් පෙළෙමින් බලවත් සේ නොසන්සුන් බවට පත් වෙති. තද බල තපුරු ස්වභාවයක් දක්වති."

ජේන් ගුඩ්ඕල් පර්යේෂකවරිය අවුරුදු හතළිහක් තිස්සේ ටැන්සිනියාවේ ගොම්බේ ජාතික වනෝද්‍යානයේ දී චිම්පන්සි පිළිබඳ සොයා බලමින් සිටී. චිම්පන්සි විසින් කරනු ලබන සෑම දෙයක්ම ඇය විසින් සටහන් කර ගනු ලැබිණි. මේ විද්‍යාඥවරියගේ ක්‍රියාකාරකම් නිසා සත්ත්ව විද්‍යාඥයන්ට තමන්ගේ කිට්ටුම නෑදෑයන් පිළිබඳ බොහෝ දේ දැන ගැනීමට හැකි වී ඇත. ආචාර්ය ගුඩ්ඕල් චිම්පන්සි ගැන හොඳම පර්යේෂණය කළ නිසා ඔවුන් ගැන සොයා බලා ආරක්ෂා කළ නිසා වනයේ ජීවත්වන චිම්පන්සින්ගේ වීරවරියක ද මව්වරියක ද ලෙස සැලකිය හැකි ය. චිම්පන්සි සමාජයේ එකිනෙකා එක්සත්ව කටයුතු කරනු ලැබේ. එයට හේතුව සියලු දෙනාම උපතේ සිට මරණය දක්වා තමන්ගේ සමාජය තුළ සිටින නිසා ය. වැඩිහිටි පිරිමින්ට තනිව ගමත් බිමත් යෑමට අවසර නැත. එහෙත් මව සහ දරුවන් එකට සිටිය යුතු ය. චිම්පන්සි පවුලක් තුළ එකිනෙකා අතර ජීවිත කාලය තුළම බැඳීම්වලින් වෙළී සිටිති.

චිම්පන්සි සමාජය තුළ මෙය ශක්තිමත් අයුරින් දකින්නට ලැබෙන්නේ යැයි ගොම්බේ ජාතික වනෝද්‍යානයේ පර්යේෂණය කළ ජේන් ගුඩ්ඕල් සොයා ගත්තාය. මේ සම්බන්ධතාව විශේෂයෙන් සෙනෙහසින් බැඳුනකි. මෙම සමීප සම්බන්ධතා බොහෝ විට දක්නට ඇත්තේ මවුවරුන් හා දියණියන් අතර ය. මෙය හැම විටම සත්‍යයක් වන්නේ නැත. මන්ද ඇතැම් චිම්පන්සි සමාජ එකිනෙකට වෙනස් නිසා ය.


ආචාර්ය ජේන් ගුඩ්ඕල් කියන හැටියට එක්තරා අවස්ථාවකදී පැෂන්(Passion) නමින් හැඳින්වෙන එක්තරා චිම්පන්සි ධේනුවක් අනෙක් චිම්පන්සි ගැහැනියකගේ පැටියා බලහත්කාරයෙන් උදුරා ගෙන මරා ගෙන කා ඇත. මෙම කාලය අතරතුර පැෂන් අනෙක් මව්වරුන්ට ද පහරදී ඔවුන්ගේ දරුවන් ද මාරාගෙන කා දමා ඇත. මෙම නිසා සමහර පැටව් පුදුමාකාර ලෙස අතුරුදහන් වූහ. මෙම හේතුවෙන් චිම්පන්සි පිරිමි හා ගැහැනු පැෂන් කෙරෙහි තද වෛරයෙන් පසු වූහ. ඉන් අනතුරුව ඔවුහු විවිධ අවස්ථාවලදී ඇයට පහර දුන්නාය. මෙම තත්ත්වය නතර වූයේ පැෂන් නැමැත්තියට පැටියෙක් ලැබුණු පසු විය. චිම්පන්සි තමන්ගේ පැටව් මෙසේ මරා දමා කන්නේ කලාතුරකින් බැව් ඇය පවසයි.

**වනාන්තරවල සිටින සතුරන්ට අමතරව මිනිස්සු ද චිම්පන්සියන්ගේ සතුරෝ වෙති. මිනිසුන්ට සමීප වීමට චිම්පන්සි දක්වන්නේ බලවත් අකමැත්තකි. ඒ තමන්ගේ වර්ගයාගෙන් ම පැවත ගෙන එන මිනිසාගෙන් ඇතිවන නිමක් නැති හිරිහැර නිසා ය.**

ආචාර්ය ගුඩ්ඕල් චිම්පන්සි කණ්ඩායම් දෙකක් අතර යුද්ධයක් දැක තිබේ. ඒ ගොම්බේ වන රක්ෂිත පෙදෙසේ, කුඩා චිම්පන්සි කණ්ඩායම් දෙකක් අතර ය. මෙහිදී පළමු වරට දකුණේ සිට පිරිමි කණ්ඩායමක් උතුරට පැමිණ ආහාර සොයා ගත්හ. මෙසේ නැවත නැවත මෙම ප්‍රදේශයේ ආහාර සොයා ඒමට දකුණු කණ්ඩායම පුරුදු වූහ. ඒ මෙම ප්‍රදේශයේ ආහාර වර්ග වැඩිපුර තිබුණු නිසා ය. මේ නිසා ඉක්මණින් දෙපාර්ශවයේ කණ්ඩායමේ පිරිමින් තම සීමාවල මුර සංචාරය කිරීමට පටන් ගන්නා ලදී.

මුර සංචාරය කරන විට චිම්පන්සි ගමන් කරන්නේ යුද හටයන් විලසිණි. එක් අයෙක් පිටු පස එක් අයෙක් පාදයක් හිමිහිට තබමින් සීරුවෙන් ය. එයින් ඔවුන්ගේ කලාපයේ ආරක්ෂාව තහවුරු වේ. ඔහු තම රැළ රැක ගැනීම සඳහා සටන් කරයි. ඔහුගේ කණ්ඩායමට ආගන්තුක චිම්පන්සියකුගෙන් හෝ ව්‍යාඝ්‍රයකුගෙන් හෝ තර්ජනයක් පැමිණියහොත් ලොකු පිරිමි චිම්පන්සි එම අනවසර ආගන්තුකයා පලවා හරිති. ගොම්බේ ජාතික වනෝද්‍යානයේ චිම්පන්සි පිරිමි අතර තරගයක් පැවතුන ද ඔවුන්ගේ කණ්ඩායම රැක ගැනීම සඳහා එසේ කරන්නේ ද යන්න සැක සහිත ය. එය පැහැදිලි නැත.

දිනක් දකුණේ සිට පැමිණි කණ්ඩායම උතුරු පෙදෙස දේශ සීමාව අසල උතුරේ පිරිමියකු ගසක් උඩ තනිව සිටිනු දුටුවහ. දකුණේ සියලු කණ්ඩායම් තනිව ඔහුට පහර දුන්හ. මැරෙන තුරු ඉතා දරුණු ලෙස පහර දෙන ලදී. එයට පළිගැනීමක් වශයෙන් උතුරේ කණ්ඩායම විසින් අවුරුදු තුනක් යන විට, දකුණේ කණ්ඩායමේ සිටි සියලු චිම්පන්සි පිරිස මරා දමන ලදී. දකුණේ චිම්පන්සි ගැහැනු ද එසේ මරා දමා තිබිණ. සංවිධානාත්මක යුද්ධයක් චිම්පන්සි කණ්ඩායම් දෙකක් අතර දක්නට ලැබුණේය. එය බොහෝ කලකින් සිදුවන දෙයකි. ජේන් ගුඩ්ඕල් පවසන්නේ වසර ගණනකට පසු එක් වතාවක් පමණක් මෙසේ ආගන්තුකයකුට පහර දීම අත් අය විසින් සිදු කරන බව ය.



වනාන්තරවල සිටින සතුරන්ට අමතරව මිනිස්සු ද චිම්පන්සියන්ගේ සතුරෝ වෙති. මිනිසුන්ට සමීප වීමට චිම්පන්සි දක්වන්නේ බලවත් අකමැත්තකි. ඒ තමන්ගේ වර්ගයාගෙන් ම පැවත ගෙන එන මිනිසාගෙන් ඇතිවන නිමක් නැති හිරිහැර නිසා ය. දඩයම්කරුවෝ චිම්පන්සි පැටව් අල්ලා විකුණති. එහිදී බොහෝ විට චිම්පන්සි මව මරා දමනු ලබන්නී ය.

චිම්පන්සි ශීඝ්‍රයෙන් හීනවන වානර වර්ගයකි. අද ලෝකයේ සිටින චිම්පන්සි සංඛ්‍යාව දෙලක්ෂයක් පමණයි. ආචාර්ය ජෝන් ගුඩ්ඕල් කියා සිටී.

ඇය අවුරුදු හතළිහකට වඩා වැඩි කාලයක් තිස්සේ පවත්වාගෙන යන ගොම්බේ වනෝද්‍යානයේ දැනට ඇත්තේ චිම්පන්සි එකසිය විසිපහක් පමණකි. එහෙත් ඔවුන්ට වෙනත් චිම්පන්සි කණ්ඩායම්වලට ප්‍රවේශවීමට ඉඩක් නොමැත. රක්ෂිත වනය තුළින් කොරිඩෝරයක් සඳහා අවකාශයක් වෙන් නොකළහොත් මෙම ගොම්බේ චිම්පන්සි රංචුවට ප්‍රජනනය සඳහා විවිධත්වයක් නොතිබීම නිසා වැනසී යැමට ඉඩ ඇත.

ටෲඩී නම් වූ චිම්පන්සියා සමග තනන ලද චිත්‍රපටියක දී ප්‍රචණ්ඩ ලෙස පහරදීම නිසා ඇය විසින් නගන ලද විලාපය චිත්‍රපටියේ පටිගත වී තිබේ.

ජේන් විසින් එම වීඩියෝ පටය උපයෝගී කර ගෙන මෙම චිම්පන්සියාට වධ හිංසා පැමිණවීම ගැන නඩුවක් පවරා ඇත. මෙම චිම්පන්සියාගේ විලාපය නරනව නිසා නගන ලද්දක් නොව ඇයට දී ඇති වද හිංසා නිසා බියෙන් නගන ලද විලාපයක් බව ජේන් ගුඩ්ඕල් විසින් පැමිණිල්ල ඔප්පු කරමින් පෙන්වා දී ඇත.

මෙම චිත්‍රපටියෙන් පෙන්වා දුන් සත්ත්ව හිංසාව නිසා ලොව සර්කස් කණ්ඩායම්වල හා පර්යේෂණාගාරවල චිම්පන්සින්ට කරනු ලබන විවිධ වද හිංසා වළක්වා ලීමට දැවැන්ත ව්‍යාපෘතියක් දියත් කිරීමට ආචාර්ය ගුඩ්ඕල් සමත් වූවා ය.

මෙම විද්වතිය විසින් චිම්පන්සි වර්ගයා ආරක්ෂා කිරීම සඳහා "ජේන් ගුඩ්ඕල් පදනම" නමින් ආයතනයක් ඇමෙරිකා එක්සත් ජනපදයේ පිහිටුවා ඇත.

මේ අරමුණ ඉටු කර ගැනීම සඳහා තවත් බොහෝ රටවල මධ්‍යස්ථාන පිහිටුවා තිබේ. උතුරු ඇමෙරිකාව, කැනඩාව, එක්සත් ජනපදය, නෙදර්ලන්තය, ජර්මනිය, දකුණු අප්‍රිකාව, චීන ජනරජය හා තායිවානය එම රටවල් ය. ❑